ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

සුළුතර ප්‍රජාවන් නියෝජනය කරන තරුණ තරුණියන් සඳහා සංවිධාන වර්ධනය සහ විශිෂ්ටත්වය සඳහා නව්‍ය නායකත්වය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වේ
(2026 සැප්තැම්බර් 21-25)

ශ්‍රී ලංකාවේ සුළුතර ප්‍රජාවන් නියෝජනය කරන විවිධ ක්ෂේත්‍රවල තරුණ තරුණියන් 28 දනෙක් 2026 සැප්තැම්බර් 21-25 දක්වා නොයිඩා හි ව්‍යවසායකත්වය සහ කුඩා ව්‍යාපාර සංවර්ධන ජාතික ආයතනයේ (NIESBUD) පැවති සංවිධාන වර්ධනය සහ විශිෂ්ටත්වය සඳහා නව්‍ය නායකත්වය පිළිබඳ පුහුණු වැඩසටහනක් සඳහා සහභාගී වූහ. කුසලතා සංවර්ධන සහ ව්‍යවසායකත්ව අමාත්‍යාංශය යටතේ පවතින NIESBUD ආයතනය ව්‍යවසායකත්වය සහ කුසලතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා පුහුණුව, උපදේශකත්වය සහ පර්යේෂණ යනාදිය සම්බන්ධයනේ කටයුතු කරන ප්‍රමුඛ පලෙේ ආයතනයකි.

2. සහභාගීවන්නන්ට මමෙ වැඩසටහන තුළින් සිය නායකත්ව හැකියාවන් ශක්තිමත් කරගැනීමට මනෙම නායකත්වය, සංවිධාන වර්ධනය සහ ප්‍රජා නියැළීම යනාදිය සඳහා නූතන ප්‍රවණතාවයන් සම්බන්ධයනේ ප්‍රායෝගික දැනුම සහ අවබෝධය ලබා ගැනීමට අවස්ථාව හිමි කර දී තිබිණ. මමෙ වැඩසටහනට නව්‍ය නායකත්වය, ව්‍යවසායකත්වය සහ දේශීය ආර්ථික සංවර්ධනය, ස්වයං නායකත්වය, නිර්මාණාත්මක චින්තනය, නායකත්ව රටා, උපදේශකත්වය, චින්තවේගීය බුද්ධිය, දේශගුණික විපර්යාස සම්බන්ධයනේ නායකත්වය සහ ප්‍රජා මරොත්තු දීමේ හැකියාව ඇතුළු විවිධ තේමා යටතේ සැසි රැසක් ඇතුළත් විය. වැඩසටහන අතරතුර දී ලබා ගත් දැනුම සහ කුසලතා භාවිතා කළ හැකි ආකාර හඳුනාගනිමින් නැවතත් මව්රට බලා ගිය පසු තම සංවිධාන සහ ප්‍රජාවන් තුළ ක්‍රියාත්මක කළ හැකි දෑ පිළිබඳව සැලසුම් සකස් කිරීමට ද වැඩසටහන තුළින් අවස්ථාව උදා කර වී තිබිණ.

4. සංස්කෘතික වටිනාකමකින් යුත් ස්ථාන වනෙ චාරිකා ද මමෙ පුහුණු වැඩසටහන යටතේ සංවිධානය කර තිබූ අතර ඒ අනුව මමෙ පිරිස ටාජ් මහල් සහ අග්‍රා බලකොටුව නැරඹීමට ද එක් වූහ. එහිදී ඉන්දියාවේ පොහොසත් සංස්කෘතික උරුමය දැක බලා ගැනීමට ද අවිධිමත් අන්තර් ක්‍රියාකාරකම් සහ අන්තර් සංස්කෘතික ඉගනෙුම් සඳහා ද අවස්ථාව උදා විය.

5. මමෙ වැඩසටහන ශ්‍රී ලාංකේය වෘත්තිකයන් සහ තරුණ තරුණියන්ගේ ධාරිතා ගොඩනැගීම සහ කුසලතා සංවර්ධනය සඳහා ඉන්දියාව විසින් ගන්නා ප්‍රයත්නයන්හි කොටසකි. ඉන්දිය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් සිය 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුර ශ්‍රී ලාංකික වෘත්තිකයන් සඳහා වාර්ෂිකව විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් පිරිනමන බව ප්‍රකාශ කළ අතර ඒ අනුව මමෙ වැඩසටහන සංවිධානය කර තිබිණ.

***

කොළඹ
2026 ඔක්තෝබර් 01